## ශ්‍රී ලංකා ජාතික කොංග්‍රසය

# සුබවාදී පාලනයකට රජය දිරිගන්වන කරුණු 12 ක න්‍යාය පත්‍රයක් ඉදිරිපත් කරයි

ඉදිරි මහ මැතිවරණයෙන් පසු සුබවාදී පාලනයක් උදෙසා රජය පොළඹවන හා දිරිගන්වන කරුණු දෙළහකින් යුත් න්‍යාය පත්‍රයක් ශ්‍රී ලංකා ජාතික කොන්ග්‍රසය මහජනතාවට ඉදිරිපත් කරයි. ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්නටත්, සිවිල් සමාජය ශක්තිමත් කරන්නටත් හේතුවන මෙම ප්‍රමුඛ කරුණු වෙනුවෙන් මහජනතාව සමඟ සම්මුතියකට එළැඹෙන බව එහි නායක අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා කියා සිටී.

දශක තුනකට අධික කාලයක් දේශයේ ආර්ථික සාමාජයීය කාරණා අඩාළ කරන්නට සමත් වූ ගැටුම් නිරාකරණය වී සාමය කරා ගමන් කරන මේ යුගයේදී තමන් ඇතුළු කණ්ඩායම මෙම කරුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා කැපවීමෙන් ක්‍රියා කරන බවද මොරගොඩ මහතා දක්වයි.

ජනතාවට ගරු සරු කරන දේශපාලන සංස්කෘතියක්, පුර නැගුම හා සහන සෙවන, තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කර දූෂණ අවම කිරීම, නීතිය හා යුක්තිගරුක සමාජයක්, අධ්‍යාපනයේ විප්ලවීය වෙනසක්, ආර්ථික සංවර්ධනය තුළින් සමෘද්ධිය, කාන්තා නියෝජනය සමබර කිරීම අයිතිවාසිකම් තහවුරු කිරීම, විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ඡන්ද අයිතිය ලබාදීම, අප සැමගේ ශ්‍රී ලංකාව - ජාතීන් අතර විවිධත්වය ශක්තියක් සේ සැලකීම, බලය බෙදා හැරීම මගින් ජනතාව සවිබල ගැන්වීම, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සමාජයට ශක්තියක් කර ගැනීම සහ මහ සඟරුවන කේන්ද්‍ර කරගත් බුද්ධ දර්ශනය ජාත්‍යන්තරයට පතුරවන වැඩපිළිවෙළක් ආදී මෙයට ඇතුළත්ය.